# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,232 — 2002 අප්‍රේල් 12 වැනි සිකුරාදා — 2002.04.12

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පලකිරීම්

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### විදේශ කටයුතු අමාත්‍යාංශය

### විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල ඉංග්‍රීසි ලඝුලේඛක පුරප්පාඩු පිරවීම සඳහා වූ තරඟ විභාගය - 2002/2003

විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට පත්කිරීම පිණිස ඉංග්‍රීසි ලඝුලේඛක/ ලඝුලේඛිකාවන් තෝරාගනු සඳහා රජයේ ලඝුලේඛක සේවයේ, පළාත් රාජ්‍ය/ පළාත් පාලන සේවයේ, සංස්ථා/රාජ්‍ය බැංකු වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩල වැනි අර්ධ රාජ්‍ය සේවයේත්, පෞද්ගලික අංශයේත් නියුතු ලඝුලේඛක/ ලේඛිකාවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. *යෝග්‍යතාවය* :

(i) ශ්‍රී ලාංකිකයකු විය යුතු අතර, විවාහක නම් කාලත්‍රයා ද ශ්‍රී ලංකිකයකු විය යුතුය.

(ii) අයදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනට වයස අවුරුදු 55 ට නොවැඩි වූ ද, යටත් පිරිසෙයින් අවුරුදු 05ක සේවා කාලයක් සපුරාසිටින්නා වූ ද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ යටතේ පවතින රජයේ ලඝුලේඛක සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ සහ පළාත් පාලන සේවයේ ලඝුලේඛක ලේඛිකාවන්වීම.

(iii) අයදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනට වයස අවුරුදු 55ට නොවැඩි වූ ද, යටත් පිරිසෙයින් අවුරුදු 05 සේවා කාලයක් සපුරා සිටින්නා වූ ද, ඉංග්‍රීසි ලඝුලේඛණයෙහි ප්‍රවීණතාව ඇත්තා වූ ද, රජයේ යතුරු ලේඛක සේවයේ (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) අයකු වීම.

(iv) විදේශ කටයුතු අමාත්‍යාංශයේ ගිවිසුම්කර මත සේවය කරන්නා වූ ද, අයදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනට වයස අවුරුදු 55 ට වැඩි නොවන්නා වූ ද, ලඝුලේඛක/ ලේඛිකාවන්වීම.

(v) අයදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනට වයස අවුරුදු 55ට නොවැඩි වූ ද, යටත් පිරිසෙයින් අවුරුදු 05ක පළපුරුද්දක් ඇත්තාවූ ද, සංස්ථා/ රාජ්‍ය බැංකු, වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩල වැනි අර්ධ රජයේ සංවිධානවලත් පෞද්ගලික අංශයේත් සේවය කරන ඉංග්‍රීසි ලඝුලේඛක/ ලේඛිකාවන්වීම.

*සැ. යු.* :- දැනට විදේශගත ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවය කරන අය ඉල්ලුම් කිරීමට සුදුසු නොවෙත්.

3. *තෝරාගැනීමේ ක්‍රමය* :

3.1. අයදුම්කරුවන්ට ඉංග්‍රීසි ලඝුලේඛණය විෂයෙහි පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ඇත. පරීක්ෂණයට නියමිත වේගය මිනිත්තුවට වචන 80 කි. මෙම පරීක්ෂණයෙන් සියයට 40ක් හෝ ඊට වැඩියෙන් හෝ ලකුණු ලබාගත් අයදුම්කරුවන්ට පරිගණක ප්‍රගුණතාවය විෂයයෙහි ප්‍රායෝගික පරීක්ෂණයකට සහ සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ. එසේ ද වුවත් ඉහත කී ලකුණු ප්‍රමාණයන්ට අනුව සුදුසුකම් ලත් අපේකෂක අපේක්ෂිකාවෝ සෑහෙන සංඛ්‍යාවක් නොමැති නම්, ඊට අඩු ලකුණු ලබාගත් අයද සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ අයිතිය විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සතුවේ.

පරීක්ෂණ සඳහා වෙන් කරන ලකුණු ප්‍රමාණයන් මෙසේය :-

1. ඉංග්‍රීසි ලඝුලේඛණය - ලකුණු 100
2. පරිගණක ප්‍රගුණතාවය - ලකුණු 50
3. සම්මුඛ පරීක්ෂණය - ලකුණු 50

3.2 *සම්මුඛ පරීක්ෂණය* .– විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ඇත

4. *සේවය භාරගැනීම පිළිබඳ කොන්දේසි* :

4.1 (අ) තෝරාගනු ලබන නිලධාරියෙකු, විදේශයක ශ්‍රී ලංකා දූත මණ්ඩලයක සේවයට පත් කිරීමට පෙර, මුලින්ම අවුරුදු දෙකකට නොවැඩි කාල සීමාවක් කොළඹ විදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවය කළ යුතු වේ. විදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවය කරන මුල් කාලසීමාවේ දී ඔහුගේ/ ඇයගේ වැඩ හා හැසිරීම අසතුටුදායක බව පෙනී ගියහොත් එම තෝරා ගැනීම අවලංගු කරනු ලැබීමට ඉඩ තිබේ. සේවා අවශ්‍යතාවය අනුව විදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවය කළ යුතු කාල සීමාව වෙනස් විය හැක.

(ආ) තෝරා ගනු ලබන නිලධාරීන් විදේශ දූත මණ්ඩලවලට පත් කිරීම තීරණය කරනු ලබන්නේ ඒ ඒ දූත මණ්ඩලවල අවශ්‍යතාවයන් (විදේශ භාෂා නිපුණත්වය ආදිය) හා ඒ ඒ නිලධාරින්ගේ යෝග්‍යතාවය හා නිපුණත්වය මතය. එසේ පත්වීම් තීරණය කිරීමේ දී නිලධාරීන්ගේ පෞද්ගලික දුක් ගැනවිලි හෝ අවශ්‍යතාවයන් (දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ආදිය ) සලකා බැලීමට විදේශ කටයුතු අමාත්‍යාංශය වගකීමට බැඳී නැත. තව ද තේරීම් පරීක්ෂණවල ලකුණු මත පදනම් වූ කුසලතා ලේඛනයේ අනු පිළිවෙලට පුරප්පාඩු පිරවීමට විදේශ කටයුතු අමාත්‍යාංශය කිසිසේත් බැඳී නැත.

(ඇ) තෝරාගනු ලබන නිලධාරියකු විදේශයක ශ්‍රී ලංකා දූත මණ්ඩලයකට පත් කිරීමේ දී, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නිගමනය කරනු ලබන නියමයන් හා සේවා කොන්දේසි මත සාමාන්‍යයෙන් තුන් අවුරුදු කාල සීමාවක් විදේශයන්හි සේවය කළයුතු අතර, ඒ බවට ගිවිසුමකට එළැඹිය යුතු ය.

4.2 සංස්ථාවලින්, රාජ්‍ය බැංකුවලින්, ව්‍යවස්ථාපිත මණ්ඩලවලින් සහ පෞද්ගලික අංශයෙන් ගනු ලබන ඉංග්‍රීසි ලඝුලේඛක/ ලේඛිකාවන් (මුල් වරට අමාත්‍යාංශයේ අවුරුදු 02 ක් ද, දූත මණ්ඩලයක අවුරුදු 03ක් ද වන සේ) අමාත්‍යාංශයේ සහ දූත මණ්ඩලවල අවුරුදු 05ක ගිවිසුම්කර කාල සීමාවකට සේවය කළ යුතුය. එසේ ද වුවත්, සේවයේ අවශ්‍යතාවය අනුව විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහ දූත මණ්ඩලවල සේවා කාලය වෙනස් විය හැකිය. අවුරුදු 05 ක ගිවිසුම්කාර සේවා කාලය අවසන් වූ පසු ඔවුන් කලින් දැරූ තනතුරුවලට ආපසු හරවා යවනු ඇත.

4.3 තෝරාගනු ලබන රජයේ සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ හා පළාත් පාලන සේවයේ නියුතු අයට දැනට ලැබෙන වැටුප් ක්‍රමය මත දිගටම වැටුප් ගෙවන අතර, සෙසු නිලධාරීන්ට මසකට රු. 7,800 ක් වූ ස්ථිර වැටුපක් ගෙවනු ලැබේ. මීට අමතරව, ඔවුන් විදේශයේ ශ්‍රී ලංකා දූත මණ්ඩලයක සේවය කරන කාලය තුළ පවත්නා නීති හා රෙගුලාසි අනුව විදේශ දීමානාවක් ද ගෙවනු ලැබේ.

4.4 තෝරා ගනු ලබන නිලධරයෙකු විදේශයක ශ්‍රී ලංකා දූත මණ්ඩලයකට පත්කර යවන විට, එම නිලධාරියාත්, ඔහුගේ/ඇයගේ කාලත්‍රයාත්, සුදුසුකම් ඇති දරුවන් දෙදෙනෙකුත් සඳහා පමණක් පත්වීම ලත් රටට යාමටත්, ආපසු ඒමටත්, යානා පත්‍ර පිරිවැය ද එහි නවාතැන් පහසුව ද, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නිගමනය කරන පරිදි වෙනත් දීමනා ද රජයේ වියදමින් දරනු ලැබේ. (මේ වගන්තියේ කාර්යය සඳහා සුදුසුකම් ඇති දරුවන් වන්නේ වයස අවුරුදු 21 ට අඩු අවිවාහක දරුවන් වේ.)

5. *අයදුම් කරන පිළිවෙල* :

5.1 මුද්‍රිත අයදුම්පත් නිකුත් කිරීමක් නැත. අපේක්ෂක/ අපේක්ෂිකාවන් මෙම දැන්වීම සමඟ ඇති ආදර්ශ ආකෘති පත්‍රය, අනුව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක තම අයදුම්පත් තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. විදේශයේ සේවය සඳහා අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ යෝග්‍යතාවය ගැන ද, තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය වහාම මුදා හල හැකි බවට ද, අයදුම්පතේ දැක්වෙන තොරතුරු නිවැරදි බවටද දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සටහනක් සෑම අයදුම්පතකම තිබිය යුතු ය.

5.2 අයදුම්පත 2002.05.18 වැනි දින හෝ ඊට පෙර හෝ බත්තරමුල්ල, පැලවත්ත, විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙනු පිණිස ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු අතර අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ "විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල ඉංග්‍රීසි ලඝුලේඛක පුරප්පාඩු පිරවීම සඳහා විභාගය" යනුවෙන් සළකුණු කොට තිබිය යුතුය. එදිනට පසු ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

6. *විභාග ගාස්තු*.- විභාග ගාස්තු රු. 200 කි. මෙම ගාස්තුව ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා එතැනින් ලබාගන්නා කුවිතාන්සිය අයදුම්පතේ නිසි කොටුවෙහි අලවා (කුවිතාන්සි අංකය, දිනය සහ තැපැල් කාර්යාලය සඳහන් කර ) තිබිය යුතුය. කිසිදු හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. විභාග ගාස්තු ගෙවීම සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර හෝ භාරගනු නොලැබේ.

7. සෑම අතින්ම සම්පූර්ණ නොවූ අයදුම්පතක් වෙතොත් එය ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. අයදුම්පතක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ ඉදිරිපත් කෙරෙන පැමිණිළි ගැන සලකා බලනු නොලැබේ.

8. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. පිළිගන්නට යෙදුනු අයදුම්පත් එවූ අයදුම්කරුවන්/කාරියන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත විභාගයට කැඳවනු ලැබේ. ලිඛිත විභාගය සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබූ විට ඒ බවට පුවත්පත්වල දැන්වීමක් පළ කරවනු ලැබේ.

නිහාල් රුද්‍රිගෝ,
ලේකම්,
විදේශ කටයුතු අමාත්‍යාංශය.

2002 මාර්තු මස 21 වැනි දින,
කොළඹ 01,
තැ. පෙ. අංක 583,
ජනරජ ගොඩනැගිල්ලේ, විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

### ආදර්ශ ආකෘති පත්‍රය I

***විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල ඉංග්‍රීසි ලඝුලේඛක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය***

(2 : II 2: III සහ 2: IV යටතේ වූ අයදුම්කරුවන් සඳහා පමණි.)

*" අ " කොටස*

අංකය :——————.
(කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි)

01. (අ) අයදුම්කරුගේ /කාරියගේ සම්පූර්ණ නම :——————.
    (ආ) මුලකුරු සමඟ අගට යෙදෙන නම :——————.
02. (අ) උපන් දිනය :
    අවුරුද්ද :————, මාසය :————, දිනය :————,
    (ආ) අයදුම්පත් භාරගැනීම අවසන් කරන දිනට වයස :
    අවුරුදු :————, මාස :————, දින :————,
03. ලිපිනය:
    (අ) කාර්යාලීය :——————.
    (ආ) පෞද්ගලික :——————.
04. විවාහක / අවිවාහක තත්ත්වය :——————.
05. විවාහක නම් කාලත්‍රයාගේ නම සහ ජාතිය :——————.
06. විවාහක නම් දරුවන් ගණන සහ ඔවුන්ගේ උපන් දිනයන් සහ වයස් :——————.
07. කලත්‍රයා රැකියාවක යෙදේ නම් ඒ පිළිබඳ තොරතුරු (රාජ්‍ය නිලධාරියෙකු නම් සියලු විස්තර සඳහන් කරන්න) :——————.
08. (i) අධ්‍යාපන සුදුසුකම් (භාෂා මාධ්‍යය සමඟ ) :——————.
09. රාජ්‍ය සේවයට / පළාත් රාජ්‍ය සේවයට / පළාත් පාලන සේවයට පළමු පත්වීම ලැබූ දිනය සහ භාෂා මාධ්‍යය :-
    (අදාල නොවන සේවාවන් කපා හරින්න.)
10. පත්වීම ස්ථිර කළ දිනය :——————.
11. දැනට සිටින ශ්‍රේණිය සහ ඊට පත්වූ දිනය (මාධ්‍ය සඳහන් කරන්න.) :——————.
12. දැනට ලබන වාර්ෂික වැටුප :——————.
13. දැනට නියුතු රාජකාරියේ ස්වභාවය :——————.
14. වේගය :
    (අ) ඉංග්‍රීසි ලඝු ලේඛණය :——————.
    (ආ) ඉංග්‍රීසි යතුරු ලියනය :——————.
15. ප්‍රවීණතාවය :
    (අ) ඉංග්‍රීසි භාෂාව :——————.
    (ආ) සිංහල/දෙමළ භාෂාව :——————.
    (ඇ) පරිගණක ප්‍රගුණතාවය :——————.
    (ඈ) වෙනත් විදේශ භාෂා :——————.
16. අයදුම්කරු/කාරිය මීට පෙර විදේශයක ශ්‍රී ලංකා දූත මණ්ඩලයක සේවය කර ඇත්නම් එම දූත මණ්ඩල සහ දින වකවානු :——————.
17. වෙනත් සුදුසුකම් කිසිවක් වෙතොත් ඒවා :——————.

ගැසට් පත්‍රයේ දැක්වෙන පරිදි විභාග ගාස්තු සඳහා නියමිත මුදල ගෙවූ බවට තැපැල් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සිය මෙහි ඇලවිය යුතුයි.

1. කුවිතාන්සියේ අංකය :———.
2. තැපැල් කාර්යාලය:———.
3. දිනය:———.
4. මුදල:———.

18. අයදුම්කරුගේ සහතිකය :

2002.......................... වැනි දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ මවිසින් නියමිත සියලු වැටුප් වැඩිවීම් උපයාගෙන ඇති බවත්, කිසිදු ආකාරයකට (අවවාද කිරීම් හැර ) විනය දඬුවමකට භාජනය වී නැති බවත් මෙයින් ප්‍රකාශ කරමි. මා දන්නා තරමින් මේ ආකෘති පත්‍රයේ සපයා ඇති තොරතුරු නිවැරදි බවත් සත්‍ය බවත් ප්‍රකාශ කරමි.

——————,
අයදුම්කරුගේ /කාරියගේ අත්සන.

දිනය :——————.

*"ආ " කොටස*

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය
(දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පිරවීමට)

අයදුම්කරු/අයදුම්කාරිය වන..........................................මහතා/මිය/මෙනවිය ..............................දින සිට මේ ආයතනයේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, තිබෙන ලේඛණ අනුව ඉහත දී තිබෙන තොරතුරු නිවැරදි බවත්, ඔහු/ඇය..................................වන දින මා ඉදිරිපිට දී අත්සන් තැබූ බවත් මෙයින් සහතික කරමි.

මෙම නිළධාරියා / නිලධාරිනිය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් වහා මුදාහල හැකිවේ.

——————.
දෙපාර්තමේන්තු ප්‍රධානියා.

නම :——————.
පදවි නාමය :——————.
දිනය :——————.

### ආදර්ශ ආකෘති පත්‍රය II

***විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල ඉංග්‍රීසි ලඝුලේඛක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය***

(2 V යටතේ අයදුම්කරුවන් සඳහා)

*" අ " කොටස*

අංකය : ——————,
(කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි)

01. (අ) අයදුම්කරුගේ /කාරියගේ සම්පූර්ණ නම : ——————,
    (ආ) මුලකුරු සමඟ අගට යෙදෙන නම : ——————,
02. (අ) උපන් දිනය :
    අවුරුද්ද : ————, මාසය : ————,දිනය : ————,
    (ආ) අයදුම්පත් භාරගැනීම අවසන් කරන දිනට වයස :
    අවුරුදු : ————, මාස : ————, දින : ————,
03. ලිපිනය : ——————,
    (අ) කාර්යාලයීය : ——————,
    (ආ) පෞද්ගලික : ——————,
04. විවාහක/අවිවාහක තත්ත්වය : ——————,
05. විවාහක නම් කලත්‍රයාගේ නම සහ ජාතිය : ——————,
06. විවාහක නම් දරුවන් ගණන සහ ඔවුන්ගේ උපන් දිනයන් සහ වයස් : ——————,
07. කලත්‍රයා රැකියාවක යෙදේ නම් ඒ පිළිබඳ තොරතුරු (රාජ්‍ය නිලධාරියෙකු නම් සියලු විස්තර සඳහන් කරන්න): ——————,
08. අධ්‍යාපන සුදුසුකම් (භාෂා මාධ්‍යය සමඟ) : ——————,
09. අයදුම්කරු /අයදුම්කාරිය අයදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනට පෙර පස් වසර තුළ සේවය කළ ආයතනවල නම් සහ සේවා කාල :

| *ආයතනයේ නම* | *පදවිය* | *කාලය* | |
| --- | --- | --- | --- |
| | | *සිට* | *දක්වා* |
| | | | |

10. දැනට ලබන වාර්ෂික වැටුප : ——————,
11. දැනට නියුතු රාජකාරියේ ස්වභාවය : ——————,
12. වේගය :
    (අ) ඉංග්‍රීසි ලඝු ලේඛණය : ————,
    (ආ) ඉංග්‍රීසි යතුරු ලියනය : ————,
13. ප්‍රවීණතාවය :
    (අ) ඉංග්‍රීසි භාෂාව : ————,
    (ආ) සිංහල/දෙමළ භාෂාව : ————,

(ඈ) පරිගණක ප්‍රගුණතාවය : ———,
(ඈ) වෙනත් විදේශ භාෂා : ———,

14. අයදුම්කරු/කාරිය මීට පෙර විදේශයක ශ්‍රී ලංකා දූත මණ්ඩලයක සේවය කර ඇත්නම් එම දූත මණ්ඩල සහ දින වකවානු : ————,

15. වෙනත් සුදුසුකම් කිසිවක් වෙතොත් ඒවා : ————,

16. ගැසට් පත්‍රයේ දැක්වෙන පරිදි විභාග ගාස්තු සඳහා නියමිත මුදල ගෙවූ බවට තැපැල් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සිය මෙහි ඇලවිය යුතුය.

1. කුවිතාන්සියේ අංකය : ————,
2. තැපැල් කාර්යාලය : ————,
3. දිනය : ————,
4. මුදල : ————,

*අයදුම්කරුගේ සහතිකය :*

මෙම අයදුම්පතේ සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, සත්‍ය බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව හෙළිදරව් වුවහොත් තෝරා ගැනීමට පෙර මා නුසුදුස්සෙකු වන බවත්, පත් කිරීමෙන් පසු අනාවරණය වුවහොත් වන්දියකින් තොරව සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ/ කාරියගේ අත්සන.

දිනය : ———,

*"ආ" කොටස*

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

(ආයතන ප්‍රධානියා විසින් පිරවීමට)

අයදුම්කරු/අයදුම්කාරිය වන..........................................මහතා /මිය/මෙනෙවිය ......................දින සිට මේ ආයතනයේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, තිබෙන ලේඛණ අනුව ඉහත දී තිබෙන තොරතුරු නිවැරදි බවත්, ඔහු/ඇය ..........................වන දින මා ඉදිරිපිට දී අත්සන් තැබූ බවත් මෙයින් සහතික කරමි.

මෙම නිලධාරියා / නිලධාරිනිය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය දැනට දරන තනතුරෙන් වහා මුදාහල හැකිවේ.

————,
ආයතන ප්‍රධානියා.

නම : ————,
පදවි නාමය : ————,
දිනය : ————,

04-176

---

## රාජ්‍ය සේවයේ ලිපිකරු හා ආශ්‍රිත සේවා තනතුරු සඳහා බඳවා ගැනීමේ පොදු තරග විභාගය - 2002 (සංශෝධනය)

2002.03.22 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද යථෝක්ත විභාග නිවේදනය සබැඳේ.

02. එහි සිංහල මාධ්‍ය පිටපතෙහි සඳහන් විභාග අයදුම්පතෙහි අනු අංක පිළිවෙලෙහි වෙනසක් සිදුව ඇත. එකී අයදුම්පත්‍රයෙහි සඳහන් අනු අංක පහත දැක්වෙන අයදුම්පත්‍රයෙහි පරිදි සංශෝධනය විය යුතුය. එකී නිවේදනයෙහි සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතිනු ඇත.

ඒ. පී. මුණසිංහ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ,
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
ප්‍රතිසංස්කරණ ලේකම් වෙනුවට.

2002 මාර්තු මස 26 වැනි දින,
කොළඹ 07, නිදහස් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ
සහ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ දී ය.

### ආදර්ශ අයදුම් පත්‍රය

**රාජ්‍ය සේවයේ ලිපිකරු හා ආශ්‍රිත සේවා තනතුරු සඳහා බඳවා ගැනීමේ පොදු තරග විභාගය - 2002**

(දෙන ලද කොටු තුළ නිවැරදි සංකේතය/අංකය පැහැදිලිව සටහන් කරන්න )

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

| | නගරය | නගර අංකය |
|---|---|---|
| 1. | | |

(*ගැසට්* නිවේදනය අනුව ඉල්ලුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය සඳහන් කරන්න.)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

| | |
|---|---|
| සිංහල | S |
| දෙමළ | T |
| ඉංග්‍රීසි | E |

(අදාල ඉංග්‍රීසි අක්ෂරය කොටුව තුළ ලියන්න.)

පුරප්පාඩු සඳහා තරග කිරීමට *ගැසට්* නිවේදනයේ 5 (1) (ආ) ඡේදයට අනුකූලව ඔබ තෝරා ගන්නා දිස්ත්‍රික්කය (දිස්ත්‍රික්ක අංක සහිත උපලේඛනය - 1 බලන්න. )

(i) දිස්ත්‍රික් අංකය :
(ii) දිස්ත්‍රික්කය :————.

අයදුම්කරන තනතුර :————.
තනතුරු අංකය :
(*ගැසට්* නිවේදනයේ 1.1 බලන්න.)

---

1.0 නම :
1.1 මුලකුරු සමඟ නම MR./MRS./MISS :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන් / දෙමළෙන් )
1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන් / දෙමළෙන් )
2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - F පුරුෂ - M
(අදාල ඉංග්‍රීසි අක්ෂරය කොටුව තුළ ලියන්න.)
3.2 උපන් දිනය: වර්ෂය මාසය දිනය
3.3 2002.03.31 දිනට වයස: අවු. මාස දින

4.0 ඔබ පොත් තැබීම විෂයයට පෙනී සිටින්නේ ද ?
(*ගැසට්* නිවේදනයේ 3.4 ඡේදය බලන්න.)
ඔව් - 1 නැත – 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

5.0 ඔබ විභාගයට පෙනී සිටින්නේ *ගැසට්* නිවේදනයේ 6.0 ඡේදයේ ප්‍රකාර ආබාධිත පුනරුත්ථාපන කොන්දේසි යටතේ ද ? ඔව් -1 නැත-2
(අදාල අංකය කොටුව තුළ ලියන්න.)

6.0 6.1 දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිටද ? :————.
6.2 ප්‍රාදේශීය උපදිසාපති/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :————.
6.3 ග්‍රාම නිලධාරී කොට්ඨාශය :————.

7.0 අධ්‍යාපන සුදුසුකම් :————.
7.1 අ.පො. ස. (සා.පෙළ)/ජා. පො. අ. ස. විභාගය පිළිබඳ විස්තර :
*පළමුවර* :
(i) විභාගයේ නම :————.
(ii) විභාගයේ වර්ෂය හා මාසය :————.
(iii) විභාග අංකය :————.
(iv) ප්‍රතිඵල :————.

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

7.2 අ.පො. ස. (සා. පෙළ)/ජා. පො. අ. ස. විභාගය පිළිබඳ විස්තර :
*දෙවනවර* :
(i) විභාගයේ නම :————.
(ii) විභාගයේ වර්ෂය හා මාසය :————.
(iii) විභාග අංකය :————.
(iv) ප්‍රතිඵල :————.

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

7.3 අ.පො.ස (උ.පෙළ) විභාගය සමත් වී ඇත්නම් ඒ පිළිබඳ විස්තර :
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

7.4. පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා ඇත්නම්,
(i) විශ්ව විද්‍යාලය :————.
(ii) උපාධිය :————.
(iii) විභාග වර්ෂය :————.

8.0 වෙනත් සුදුසුකම් :

9.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ? (අදාල කොටුවේ √ ලකුණ යොදන්න.)
(ඔව් නම් විස්තර සඳහන් කරන්න.) ඔව් නැත

10.0 විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය :————.
ලදුපත් අංකය හා දිනය :————.

(ලදුපත නොගැළවෙන සේ මෙහි අලවන්න.)

11.0 *අයදුම්කරුගේ සහතිකය* :—

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) මම විභාගයේ කොන්දේසි සියල්ල පිළිපැදීමට එකඟ වෙමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද ඔහු/ඇය මා ඉදිරිපිට දී ...............දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

04-178

---

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පලකිරීම්

## බඩුබාහිරාදිය විකිණීම්

### මහෙස්ත්‍රාත් අධිකරණය-ගාල්ල

**අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් ද්‍රව්‍යයන් 2002.04.28 පෙ. ව. 9.30ට මෙම අධිකරණ භූමිය තුළදීම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් කිසිම ද්‍රව්‍යයක් පිළිබඳ හිමිකම් දක්වන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයක් මහජනයාට පරීක්ෂා කළ හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවන් හි දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැණීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එවෙලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. භාණ්ඩ ගැනුම්කරුගේ ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතු ය.

එම්. සී. බී. එස්. මොරයාස්,
මහෙස්ත්‍රාත්-ගාල්ල.

2002 මාර්තු මස 14 වන දින,
ගාල්ල, මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| | | | |
|---|---|---|---|
| 01. | ඒආර් 1562 | ස්පෝට් පාපැදි | 01යි |
| 02. | ඒආර් 1700 | කලුපාට පාපැදි | 01යි |
| 03. | ඒආර් 1874 | රතුපාට පාපැදි | 01යි |
| 04. | ඒආර් 1877 | හීරෝ පාපැදි | 01යි |
| 05. | ඒආර් 1881 | පාපැදි | 01යි |
| 06. | ඒආර් 1883 | නිකල් මඩ්ගාඩ් සහිත පාපැදි | 01යි |
| 07. | ඒආර් 1886 | ප්‍රේම් එක දිරාගිය පාපැදි | 01යි |
| 08. | ඒආර් 2008 | හීරෝ වර්ගයේ පාපැදි | 01යි |
| 09. | ඒආර් 2070 | ඉදිරි රෝදය නොමැති පාපැදි | 01යි |
| 10. | ඒආර් 2093 | ස්ටෑන්ඩ් වර්ගයේ පාපැදි | 01යි |
| 11. | ඒආර් 2095 | අංකය අපැහැදිලි කලුපාට පාපැදි | 01යි |
| 12. | ඒආර් 2195 | **i.** හීරෝ වර්ගයේ පාපැදිය<br>**ii. Asia Bike** වර්ගයේ පාපැදිය<br>**iii**. අංකය අපහැදිලි පාපැදිය | |
| 13. | ඒආර් 2359 | අංකය අපැහැදිලි කලුපාට පාපැදි | 01යි |
| 14. | ඒආර් 2123 | දුඹුරු පාට පාපැදි | 01යි |
| 15. | ඒආර් 458 | පාපැදි 01යි | |
| 16. | ඒආර් 642 | කලුපාට පාපැදි | 01යි |
| 17. | ඒආර් 713 | (කාන්තා) පාපැදි | 01යි |
| 18. | ඒආර් 714 | රැලේ වර්ගයේ පාපැදි | 01යි |
| 19. | ඒආර් 2451 | අංකය හා වර්ගයේ අපැහැදිලි පාපැදි | 01යි |
| 20. | ඒආර් 787 | ට්‍රයිසිකල් | 01යි |
| 21. | ඒආර් 66 | අංකය අපැහැදිලි එවෝන් වර්ගයේ පාපැදිය | |
| 22. | ඒආර් 05 | අංකය හා වර්ණය අපැහැදිලි පාපැදි | 01යි |
| 23. | ඒආර් 38 | අංක හා වර්ණය අපැහැදිලි පාපැදි | 01යි |
| 24. | ඒආර් 111 | අංක සීසී 1738688 දරන කලුපැහැති පාපැදි 01යි | |
| 25. | ඒආර් 1704 | 92 ශ්‍රී 7838 දරන **x**එල් වර්ගයේ යතුරු පැදිය | |
| 26. | ඒආර් 1882 | 105 ශ්‍රී 7649 දරන එම්බී 5 වර්ගයේ යතුරු පැදිය | |
| 27. | ඒආර් 1873 | 89 ශ්‍රී 6000 දරන යතුරු පැදිය | |
| 28. | ඒආර් 2090 | 126 ශ්‍රී 3870 දරන යමහා යතුරු පැදිය | |
| 29. | ඒආර් 2089 | අංක රහිත යමහා මේට් 50 වර්ගයේ යතුරු පැදිය | |
| 30. | ඒආර් 2398 | 109 ශ්‍රී 8607 දරන යතුරු පැදිය | |
| 31. | ඒආර් 58116 | 132-8402 දරන යතුරු පැදිය | |
| 32. | ඒආර් 57209 | 105-6761 දරන යතුරු පැදිය | |
| 33. | ඒආර් 71689 | 110-7985 දරන යතුරු පැදිය | |
| 34. | ඒආර් 1004 | ගොල්ඩ්ස්ටාර් වර්ගයේ රූපවාහිනී යන්ත්‍ර | 01යි |
| 35. | ඒආර් 1659 | කාර් කැසට් රේඩියෝ | 01යි |
| 36. | ඒආර් 1560 | කළුපාට බපල් 02ක් සහිත තැටි ධාවන යන්ත්‍ර 01යි | |
| 37. | ඒආර් 1448 | එස්එම් 333 වර්ගයේ කැමරා | 01යි |
| 38. | ඒආර් 1520 | කැසට් රේඩියෝ | 01යි |
| 39. | ඒආර් 1878 | වතුර මෝටර් | 01යි |
| 40. | ඒආර් 2092 | 9' 2'' අලවංගු | 01යි |
| 41. | ඒආර් 2232 | පූජිකා වර්ගයේ කැමරා | 01යි |
| 42. | ඒආර් 1279 | මැටියෙන් තනන ලද විවිධ රූප | 15යි. |
| 43. | ඒආර් 214 | නැෂනල් පැනසොනික් වර්ගයේ කැසට් | 01යි |
| 44. | ඒආර් 217 | නැෂනල් පැනසොනික් වර්ගයේ කැසට් | 01යි |
| 45. | ඒආර් 519 | බිත්ති ඔරලෝසු | 01යි |
| 46. | ඒආර් 209 | වාහන ජැක් | 01යි |
| 47. | ඒආර් 410 | බපල් රහිත කැසට් | 01යි |
| 48. | ඒආර් 2541 | වාහන ජැක් 01යි | |
| 49. | | අංක රහිත ජංගම ලී ඉරන මැෂින් | 04යි |
| 50. | ඒආර් 152 | විදුලි පන්දම් | 01යි |
| 51. | ඒආර් 845 | නැෂනල් පැනසොනික් වර්ගයේ කැසට් | 01යි |

| | | | |
|---|---|---|---|
| 52. | ඒආර් 4481 | i. 26''ක් දිග ගාංචුවක් සහිත රන් පැහැති චේන් | 01යි |
| | | i i. 25 1/2''ක් දිග රන් පැහැති චේන් | 01යි |
| | | i i i. 2 1/2''ක් දිග විෂ්කම්භයක් ඇති වලලු 02යි | |
| 53. | ඒආර් 682 | නිල් ගලක් අල්ලන ලද මුදු | 01යි |
| 54. | ඒආර් 217 | 1. සිහින් දගර සහිත චේන් | 01යි |
| | | 2. බෝකොළ හැඩයේ පෙන්ඩන් | 01යි |
| | | 3. ජිප්සි වර්ගයේ කරාබු ජෝඩුවයි | |
| | | 4. රවුම් මුදු | 01යි |
| | | 5. අත් ඔරලෝසු | 01යි |
| 55. | ඒආර් 1708 | රන් පැහැති මුදු | 01යි |
| | | අත් ඔරලෝසු | 01යි |
| 56. | ඒආර් 1021 | ජේ අකුර සහිත රන් මුදු | 01යි |
| 57. | ඒආර් 77154 | රන් පැහැති මුදු | 02යි |
| 58. | ඒආර් 77390 | ගෑස් සිලින්ඩර් | 01යි |
| | | ගෑස් ලිප් | 01යි |
| 59. | | අංක රහිත වැලිගොඩ දමන ලද පතිට්ටු | 03යි |
| 60. | | අංක රහිත සවල් | 05යි |
| 61. | | අංක රහිත තරාදි විශාල ප්‍රමාණයක් | |
| 63. | | අංක රහිත යකඩ කුඩ විශාල ප්‍රමාණයක් | |
| 64. | | හිස් අරක්කු හා බියර් බෝතල් විශාල ප්‍රමාණයක් | |
| 65. | | තලන ලද තඹ දගර | |
| 66. | | විවිධ ප්‍රමාණයේ බුලි විශාල තොගයක් | |
| 67. | | විවිධ ප්‍රමාණයේ කෑන් විශාල තොගයක් | |

04-121

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

දෙහිවල, ඉනිසියම් පාර, අංක 41/2 සෙල්ලතුරෙයි සුබ්‍රමණියම් වන මම කොළඹ දිස්ත්‍රික්කයේ දෙමළ භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත් වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා 107 අධිකාරය වන නොතාරිස් ආඥාපනතේ 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලුදෙනාම වෙත මෙයින් දන්වා සිටිමි.

එස්. සුබ්‍රමණියම්.

2002 මාර්තු මස 21 දින,
දෙහිවල දී ය.
04-117

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මීගමුව, ලුවිස් පෙදෙසේ, අංක 164 දරන ස්ථානයේ පදිංචි ඩොෂිටා ටකාෂි වන මම මීගමුවේ සාප්පු සංකීර්ණයේ අංක 76 දරන ස්ථානයේ පදිංචි ෂෙයිනුලාබ් දීන් මොහොමඩ් මෂාහිම් යන අය වෙත ප්‍රදානය කරන ලද ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. සී. කේ. විජේසිංහ මහත්මිය සහතික කරන ලද අංක 1985 සහ 1999.05.08 දින දරන විශේෂ ඇටර්නි බලය වර්ෂ 2002ක් වූ මාර්තු මස 23 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

2002 මාර්තු මස 23 වැනි දින,
මීගමුවේ දී ය.
04–136

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

අංක 341, අඹතලේ, අංගොඩ පදිංචි අත්තනායක මුදියන්සේලාගේ අත්තනායක වන මම කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥාපනතේ (107 වැනි අධිකාරයේ) 7 වැනි වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව ශ්‍රී ලංකා ජනරජයේ සියළුම මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

ඒ. එම්. අත්තනායක.

2002 මාර්තු මස 26 වැනි දින,
අංක 341, අඹතලේ,
අංගොඩ.
04–152

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

ගුන්නෑපාන, උඩගුන්නෑපාන අංක 196/7 දරන ස්ථානයේ පදිංචි ජයසිංහ මුදියන්සේලෑ උඩ වලව්වේ සෙනෙවිරත්න බණ්ඩා වන මම, මහනුවර දිස්ත්‍රික්කයේ, සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙණී සිටීම පිණිස 107 අධිකාරය වන නොතාරිස් ආඥාපනතේ 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

ප්‍රතිඥාත නොතාරිස් ලිපිකරු.

2002 මාර්තු මස 20 වැනි දින,
ජේ. එම්. යූ. ඩබ්ලිව්. සෙනෙවිරත්න බණ්ඩා,
අංක 196/7, උඩගුන්නෑපාන, ගුන්නෑපාන.
04-158

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

අංක 41/4, ජයසූරිය වත්ත හොරණ පදිංචි ශ්‍රීමතී දීපිකා දිසානායක වන මම කළුතර දිස්ත්‍රික්කයේ, සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස 107 නොතාරිස් ආඥාපනතේ 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව උතුම් වූ ස්වෛරී ස්වාධීන ශ්‍රී ලංකා ජනරජයට සහ මහජනයා වෙත මෙයින් දන්වා සිටිමි.

එස්. ඩී. දිසානායක,
නොතාරිස් ලිපිකරු.

2002 මාර්තු මස 25 වැනි දින,
අංක 41/4, ජයසූරිය වත්ත,
හොරණ.
04-162

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## මහජන බැංකුව - බණ්ඩාරගම ශාඛාව

බණ්ඩාරගම මහබෙල්ලන පිහිටි මෙහි පහත විස්තරවන දේපල මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය ප්‍රකාර 2002.04.27 වෙනි දින පෙ. ව. 10. 30 ට පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### දේපල පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුණ, පානදුර තල්පිටි දෙබැද්දේ බණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාවට අයත් තල්පිටිබද්දේ, උපසභා සීමාව තුළ පිහිටි මහබෙල්ලන නමැති ගමෙහි කෝන්ගහවත්ත නැමැති ඉඩමට 1994.01.14 දින බලයලත් මිනින්දෝරු එල්. ඩබ්. එල්. ද සිල්වා මහතා විසින් පිළියෙල කරන ලද අංක 11077 දරන පිඹුරේ ලොට් 2 බී කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 1 ද, නැගෙනහිරට : ජී. ඩී. ලූබට් සහ තවත් අය හිමිකම් කියනු ලබන මිල්ලගහවත්ත සහ එම ඉඩමේ ම ලොට් 3 ද, දකුණට: මෙම ඉඩමේ ම ලොට් 3 සහ 1989 මාර්තු 06 වෙනි දින බලයලත් මිනින්දෝරු එම්. ඩී. පියසිරි මහතා විසින් සකස් කළ පිඹුරු අංක 1581 හි දැක්වෙන ලොට් 15 (මීටර් 3 ක පාරක් සඳහා වෙන්කළ බිම් කොටස) හා මෙම ඉඩමේ ම ලොට් 4 ද, බස්නාහිරට : ඉහත සඳහන් පිඹුරු අංක 11077 හි දක්වා ඇති ලොට් 2 ඒ දරන මෙම ඉඩමේ ම ලොට් 4 ද, මායිම් වූ රූඩ් එකයි පර්චස් දහනමයයි දශම හතයි බිංදුව (අ. 0 රූ. 1 ප. 19.70) ක් විශාලත්වයෙන් යුත් ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි වැව්ලි හා ගස්කොලන් ආදිය ද වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එf ජ 203/392 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

පහතින් වඩාත් විස්තර කර ඇති පාරක් සඳහා වෙන්කොට ඇති කොටසක් යෑම් ඊම් මාර්ග අයිතිය ද සමග වේ.

ඉහත විස්තර කර ඇති පරිදි මහබෙල්ලන ගමේ පිහිටි කෝන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. පියසිරි මහතා විසින් 1989 මාර්තු 06 වෙනි දින මැන පිළියෙල කරන ලද අංක 1581 දරන පිඹුරේ ලොට් අංක 15 ට (මීටර් 3ක් පළල) මායිම් උතුරට: ලොට් 4, 3, 2 හා 13 ද, නැගෙනහිරට: ලොට් 13, 14 හා ජී. ඩී ලූබට් සහ තවත් අයට අයත් මිල්ලගහවත්ත නැමැති ලොට් 11 ද දකුණට: ලොට් 10, 9, 8 සහ 5 ද, බස්නාහිරට: ලොට් 10 හා 9 ද සහිත පර්චස් දහහතයි දශම හතර (අ. 0 රූ. 0 ප. 17.4) ක් විශාලත්වය ඇති ඉඩම් කොටස ද වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එf ජ 354/58 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

වැඩි විස්තර සඳහා 2001.10.26 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2001.12.14 "දිනමිණ" සහ "ඩේලිනිවුස්" යන පුවත්පත් බලන්න.

*දේපලට පිවිසීම.*- පානදුර සිට බණ්ඩාරගම දක්වා යන මාර්ගයේ මහබෙල්ලන හංදියෙන් දකුණට ඇති පාරේ සැතපුම් 1/4ක් පමණ ගියවිට වම්පසින් හමුවන අඩි 15ක් පළල ගුරු පාරේ දකුණු පසින් පිහිටි දෙවැනි ඉඩම් කොටස අදාළ දේපල වේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය තීන්දුකළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය. ගැනුම් මිලෙන් 10%ක් ද, වෙන්දේසිකරුගේ ගාස්තු 2 1/2% ක් ද, ප්‍රාදේශීය සභාවට 1% ක් ද, වෙන්දේසි වියදම් සහ අනෙකුත් සියලුම වියදම් ද වේ. ගැනුම් මිලෙන් ඉතිරි 90% වෙන්දේසියේ දින සිට දින 30ක් ඇතුලත පානදුර ගාලු පාරේ අංක 341 දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුවේ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකාර මහතා වෙත ගෙවිය යුතුය.

ඔප්පු සහ අදාළ ලේඛන ඉහත ලිපිනයේ කළමණාකාර මහතාගෙන් ලබාගත හැක. දුරකථන අංක 034 - 32438.

සාම විනිසුරු ඒ. එස්. ලියනගේ,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ දිවුරුම්ලත් භාෂා පරිවර්තක.

අංක 228/ඒ,
වලව්වත්ත, කැස්බෑව,
දුරකථන අංක : 703478.
04-118

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය ) හා එහි සංශෝධනවල 22 වෙනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥා පනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2001.11.23 දිනැති අංක 1212 දරන *ගැසට් පත්‍රයේ* හා 2001.11.19 දිනැති දිනමිණ, තිනකරන්, ඩේලිනිව්ස් යන පුවත්පත් වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂය ද විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයෙහි විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය පිහිටි ස්ථානයේ දී ම 2002.05.04 වෙනි දින පෙ. ව. 11.00 ට කොළඹ 3, ධර්මපාල මාවතේ, අංක 55ඒ දරන ස්ථානයෙහි වෙන්දේසිකාර ෂෝක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලයේ, පල්ලේපත්තුවේ, මොරටුව සුළු නගර සභා සීමාවේ මොරටුමුල්ල හි පිහිටියාවූ දැන් අංක 115, ශ්‍රී ප්‍රේමරත්න මාවත, වරිපනම්අංක 81 දරන "කුරාගේවත්ත සහ මාරගහවත්ත " නමැති ඉඩම බලයලත් මිනින්දෝරු එස්. ලියනගේ විසින් සාදන ලද 1990 දෙසැම්බර් 09 දිනැති අංක 1063 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරට : තාපසාරාම පන්සල ද ; නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 1 ද; දකුණට : ලොට් 5 ද ; බස්නාහිරට : ලොට් 3 ද මායිම්ව පර්චස් දහයක (අ.0, රූ. 0, පර්. 10.00) බිම් ප්‍රමාණය සමග ගොඩනැගිලි ගහකොළ වැවිලි සහ එහි පිහිටි සියලු දේ වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1956/117 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු ශ්‍රී ඩී ලියනසූරිය විසින් සාදන ලද 1994 ජුනි 28 දිනැති අංක 5943 දරන මැත මිණුම් පිඹුරට අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

එකී මොරටුමුල්ලේ පිහිටියාවූ ද, දැන් අංක 115, ශ්‍රී පේමරත්න මාවත, වරිපනම් අංක 81 දරන "කුරාගේවත්ත සහ මාරගහවත්ත " නමැති ඉඩම එකී අංක 5943 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරට : තපසාරාම පන්සලේ පරිශ්‍රය ද ; නැගෙනහිරට : එම ඉඩමේ ලොට්1 ද ; දකුණට : ලොට් 5 ද ; බස්නාහිරට : ලොට් 3 ද මායිම්ව එකී අංක 5943 දරන පිඹුර අනුව පර්චස් නවයයි දශම එකක (අ. 0, රූ. 0, පර්. 9.1) බිම් ප්‍රමාණය සමග ගොඩනැගිලි ගහකොළ වැවිලි සහ එහි පිහිටි සියලු දේ වේ.

3. එකී මොරටුමුල්ලේ පිහිටියාවූ ද, දැන් අංක 115 ශ්‍රී ප්‍රේමරත්න මාවත, වරිපනම් අංක 81 දරන "කුරාගේවත්ත සහ මාරගහවත්ත " නමැති ඉඩමේ එකී අංක 1063 දරන පිඹුරේ ලොට් 4 වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරට : ලොට් 1 සහ 5 ද ; නැගෙනහිරට : ලොට් 1 ද ; දකුණට : එම්. එන්. ප්‍රනාන්දු සහ අනෙක් අයවලුන්ට අයත් පරිශ්‍රය ද (අංක 3353 දරන පිඹුරේ ලොට් බී ) ; බස්නාහිරට : ලොට් 5 ද මායිම්ව එකී අංක 1063 දරන පිඹුරට අනුව පර්චස් පහයි දශම හයයි බිංදුවක (අ.0, රූ. 0, පර්. 5.60) බිම් ප්‍රමාණය සමග ගහකොළ වැවිලි සහ එහි පිහිටි සියලු දේ වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 1956/118 හි ලියාපදිංචි කර ඇත.

එකී ලොට් 4 බලයලත් මිනින්දෝරු ශ්‍රී ඩී ලියනසූරිය විසින් සාදන ලද 1994 ජුනි 28 දිනැති අංක 5943 දරන මැත මිණුම් පිඹුරට අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

එකී මොරටුමුල්ල හි පිහිටියාවූ ද, දැන් අංක 115 ශ්‍රී ප්‍රේමරත්න මාවත, වරිපනම් අංක 81, දරන "කුරාගේවත්ත සහ මාරගහවත්ත " නමැති ඉඩම එකී අංක 5943 දරන පිඹුරේ ලොට් 4 වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරට : ලොට් 5 සහ ලොට් 1 ද ; නැගෙනහිරට : ලොට් 1 ද ; දකුණට : ශ්‍රී ප්‍රේමරත්න මාවත, වරිපනම් අංක 83/6 සහ 87 දරන පරිශ්‍රය ද ; බස්නාහිරට : ශ්‍රී ප්‍රේමරත්න මාවත, වරිපනම් අංක 87 දරන පරිශ්‍රය ද සහ ලොට් 5 ද මායිම්ව එකී අංක 5943 දරන පිඹුර අනුව පර්චස් හයයි දශම පහක (අ.1, රූ. 0, පර්. 6.5) ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ ගහකොළ වැවිලි හා එහි පිහිටි සියලු දේ වේ.

### දෙවෙනි උපලේඛනය

එකී මොරටුමුල්ලෙහි පිහිටියාවූ ද, "කුරාගේවත්ත සහ මාරගහවත්ත " නමැති ඉඩම එකී අංක 1063 දරන පිඹුරේ ලොට් 5 (අඩි 10ක් පළල ) වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරට : ලොට් 2 සහ ලොට් 3 ද ; නැගෙනහිරට : ලොට් 1 සහ 4 ද; දකුණට : ලොට් 4 සහ එම්. එන්. ප්‍රනාන්දු සහ අනෙක් අයවලුන්ට අයිති පරිශ්‍රය ද ; බස්නාහිරට : ප්‍රේමරත්න මාවත සහ එම්.එන්. ප්‍රනාන්දු සහ අනෙක් අයවලුන්ට අයිති පරිශ්‍රය ද මායිම්ව එකී අංක 1063 දරන පිඹුරට අනුව පර්චස් පහක (අ.0, රූ. 0, පර්. 5.0) බිම් ප්‍රමාණයකින් යුක්තවේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1956/119 හි ලියාපදිංචි කර ඇත.

එකී ලොට් 5 බලයලත් මිනින්දෝරු ශ්‍රී ඩී ලියනසූරිය විසින් සාදන ලද 1994 ජුනි 28 දිනැති අංක 5943 දරන මැත මිණුම් පිඹුරේ පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

එකී මොරටුමුල්ලෙහි පිහිටියාවූ ද, "කුරාගේවත්ත සහ මාරගහවත්ත " නමැති ඉඩම එකී අංක 5943 දරන පිඹුරේ ලොට් 5 (අඩි 10ක් පළල) වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරට : ලොට් 3 සහ 2 ද ; නැගෙනහිරට : ලොට් 1 සහ ලොට් 4 සහ ශ්‍රී ප්‍රේමරතන මාවත, අංක 87 දරන පරිශ්‍රය ද ; දකුණට : ලොට් 4 සහ ශ්‍රී ප්‍රේමරත්න මාවත වරිපනම් අංක 87 දරන පරිශ්‍රය ද ; බස්නාහිරට : ශ්‍රී ප්‍රේමරත්න මාවත සහ ලොට් 3 සහ 2 ද මායිම්ව එකී අංක 5943 දරන පිඹුර අනුව පර්චස් හයක (අ.0, රූ. 0, පර්. 6.00) බිම් ප්‍රමාණයකින් යුක්තවේ.

යූ. ජී. ආර්. එස්. කාරියවසම්,
කළමනාකරු.

ලංකා බැංකුව,
මරදාන.
04-161

## සීමාසහිත සෙලාන් බැංකුව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුව විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර, දකුණු පලාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ මාදම්පේ පිහිටි දිනප්පු කන්කානම වගාකල මහගෙදර වත්ත නමැති (අ. 0. රූ. 0, පර්. 38.04) ක් විශාල ලොට් අංක 3 ඒ නමැති ඉඩම සහ එහි තුළ ඇති ගොඩනැගිලි, ගහකොළ ඇතුළු සියළු දේත් සමග වේ.

මෙම දේපළ අම්බලන්ගොඩ මෙන්ඩිස් සහ සමාගම යන නාමය විලාශය සහ අභිධානය යටතේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන සහ අම්බලන්ගොඩ පදිංචි හදුන්නෙත්ති අමරසිරි මෙන්ඩිස් විසින් සීමාසහිත සෙලාන් බැංකුවට උකස් කරන ලද දේපළ වර්ෂ 2002 ක්වූ මැයි මස 03 දින ප. ව. 1.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 1995.08.11 වන දින ඩේලිනිවුස්, දිවයින සහ තිනකරන් පුවත්පත් මෙන්ම 1995.08.25 වන දින *රජයේ ගැසට්* පත්‍රයද, විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2002.04.12 වන දින *රජයේ ගැසට්* පත්‍රය ද, 2002.04.15 වන දින ලංකාදීප සහ අයිලන්ඩ් පත්‍ර බලන්න.

විකිණීම ස්ථිර කල වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි.

(1) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(2) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),

(3) වෙන්දේසිකරුගේ කොමිස් ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(4) නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සකස් කිරීම රු. 2,000,
(5) ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500,
(6) සියළුම ප්‍රචාරක වියදම් ද,
(7) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී සීමාසහිත සෙලාන් බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කල යුතුයි.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

කළමනාකරු,
සෙලාන් බැංකුව,
සෙලින්කෝ සෙලාන් ටවර්ස්,
අංක 90, ගාලු පාර,
කොළඹ 03.

දුරකථන අංක : 01-456279,
074-701279.

එල්. බී. සේනානායක,
සාමවිනිසුරු, තක්සේරුකරු,
වෙන්දේසිකරු සහ
උසාවි කොමසාරිස්, බස්නාහිර පළාතේ
පළාත්බද
මහාධිකරණය, කොළඹ දිසා අධිකරණය,
රාජ්‍ය බැංකු සහ වාණිජ බැංකු
අංක 99, උසාවිය පාර,
දුරකථන/ෆැක්ස් : 445393.

04-181

---

**මහජන බැංකුව – ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය-කොළඹ උතුර**

**නුවරඑළිය-හැඩන් හිල් පාරේ, අගනා ඉඩම් වෙන්දේසිය බෙදා වෙන්කොට නිර්නය කළ ඉඩම් කොටස**

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය මහනගර සභා සීමාව ඇතුළත, නගරයේ හැඩන් හිල් පාරේ පිහිටි බලයලත් මිනින්දෝරු හා තලමිතිකරු ජී. එල්. බී. නානායක්කාර විසින් සාදන ලද 1989 දෙසැම්බර් 9 හා 10 දාතම හා අංක 8108 දරන මිණුම් පිඹුරේ ලොට් 1 බී 2 වශයෙන් ලකුණු කොට දක්වා ඇති හිල් පාරේ වරිපනම් අංක 8/B දරන බිම් කොටස එහි පිහිටි ගොඩනැගිලි, වගාවන් හා සැම සියළු දේ සමගය. ප්‍රමාණයෙන් අක්. 0, රූ. 0, පර්. 21.26 ක ඉඩම මහජන බැංකුව විසින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, ඉහත කී දේපළ 2002 අප්‍රේල් 27 වැනිදා-සෙනසුරාදා පෙ. ව. 11.00 ට ආරම්භව පිහිටි ස්ථානයේ දී මවිසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 1998.04.17 දාතම දරන රජයේ *ගැසට් පත්‍රය* ද, 1998.04.02 දින 'ඩේලිනිව්ස්', 'දිනමිණ' හා 'තිනකරන්' පුවත්පත් ද, විකුණුම් නිවේදනය සඳහා 2002.04.12 *රජයේ ගැසට්* පත්‍රය ද බලන්න.

*ගෙවීම් කළයුතු අන්දම :*

1. මිළ නිර්ණය වූ වහාම ගැණුම් මිළෙන් 10%,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු දේශීය විකුණුම් බද්ද 1% (සියයට එකයි),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. විකුණුම් පිරිවැය පිළිබඳ සමානුපාතික අයකිරීම් හා වෙනත් ගාස්තු වෙතොත් ඒවා,
5. ගැණුම් මිළෙන් ඉතිරි 90% (සියයට අනූව) වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත කොළඹ 01, ආදිපාද වීදියේ අංක 11 හි මහජන බැංකුව කොළඹ (උතුර) ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 074-717008-9.

ඉහත කී වටිනාකම ඇති මුදල ඉහත දක්වන ලද පරිදි දින 30 ක් ඇතුළත ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% (සියයට දහය) ක මුදල රාජසන්තක කොට දේපළ නැවත විකිණීමේ අයිතය බැංකුව සතුය.

ඩන්ස්ටන් කෙලාට්,
උසාවි කොමසාරිස්වරු සහ බ්‍රොකර්වරු,
විශේෂඥ වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ,
සහ දේපළ නියෝජිතවරු.

381 1/1, ගාළු පාර, කොළඹ 4
දුරකථන : 591167,
දුරකථන/-ෆැක්ස් : 500838, 584874.
ක්ෂණික ඇමතුම : 0722-50422.

04-184

---

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ජෙදය - සාමාන්‍ය

## වෙනත් පත්කිරීම් ආදිය

1978 අංක 02 දරන අධිකරණ සංවිධාන පනතේ 45 (2) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අධිකරණ, නීති ප්‍රතිසංස්කරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍ය, වි.ජ.මු. ලොකුබණ්ඩාර වන මම,

01. ඉබ්රා ලෙබ්බේ මොහොමඩ් මාහිර් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
02. අබු බකර් මොහම්මදු ඉස්මයිල් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
03. වජිර ඩිවින්ද පියදාස සිකුරාජපති මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
04. හාල්දීන් ඔමර්දීන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
05. මොහමඩ් හනීපා මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
06. විල්සන්ට් ඩයස් ගුණතිලක මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
07. ගම්පොලගේ සිරිපාල ලෙස්ලි පොන්සේකා මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
08. ජයම්පති පද්මරාජ හෙට්ටිආරච්චි මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
09. කුන්තාලි අසතාර් සහදීන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
10. දේවතා පෙඩිගෙදර බෝධිපක්ෂ මහතා, මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
11. ආර්. ආර්. ඒ. ඩබ්. එම්. දයානන්ද පිටවල මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
12. කේ. ඒ. සී. ආරියරත්න මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
13. දෙනියේ ගෙදර ජයවික්‍රමසිංහ මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
14. එස්. එච්. එම්. නිසාර් මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
15. සුප්පයියා ආනන්දන් මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
16. ඒ. ජී. මොහමඩ් ෂරීප් මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
17. බී. එම්. තාජුදීන් මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
18. කේ. එම්. මොහමඩ් පලීල් මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
19. කේ. පී. යූ. ජයසේකර මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
20. එච්. ඩී. ඒ. අනිල් කුමාර මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
21. ඒ. එච්. එම්. රාෆික් මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
22. ජී. ඒ. බී කිරින්ද මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
23. එම්. එච්. එම්. හුනයිස් මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
24. ආර්. එම්. කේ. රත්නායක මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
25. එම්. ආර්. එම්. හුරයිස් මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
26. එම්. එස්. එම්. නෂීර් මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
27. නිමල් ලොකුසූරිය මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
28. එම්. එම්. එම්. හාරිස් මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
29. එම්. කේ. එම්. මසාහිර් මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
30. මරියාපිල්ලයි මනිරාජ් මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
31. අරුනාසලම්පිල්ලයි දොරසාමි මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
32. අයි. එස්. එම්. මිහිලාර් මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
33. එම්. ජී. ආරියරත්න මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
34. ආර්. එම්. පුංචි අප්පුහාමි මහතා, ගම්පොල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
35. ටී. එන්. ටිකිරි කුමාරි දිසානායක මෙනෙවිය, කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන් ද,
36 කේ. ඩී. ලියෝ බර්ටි ලක්ෂ්මන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
37. පියසේන රණසිංහ මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
38. ආර්. ඒ. සරත් බන්දුල මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
39. ජී. බී. අනුර මාලවන මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
40. එස්. එම්. පී. මොහිදීන් මහතා මඩකලපුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
41. මාරඹ විදානගේ සරත් ද සිල්වා මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
42. අගලගමුගේ මයිකල් ඇන්තනී පෙරේරා මහතා, ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
43. කේ. අනුර සිල්වා මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
44. රාසයියා රාජ්කුමාර් මහතා, කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
45. මව්ලව් මොහොම්මදු සම්සුදීන් මොහම්මදු තස්ලිම් පූජකතුමා මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
46. අශෝක මහින්දලාල් දෙහිගහගෙදර මහතා, රත්නපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
47. එන්. එම් පුංචිබණ්ඩාර නවරත්න මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
48. ඒ. එම්. ජේ. පීරිස් මහතා, මීගමුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
49. හෙට්ටිහේවාගේ රුක්මන් ද සිල්වා මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
50. එම්. චිත්‍රලතා පෙරේරා මහත්මිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන් ද,
51. පී. බී. මැදගෙදර මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
52. මීරා සාහිබු අබ්දුල් ගපූර් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
53. මොහිඩීන් සිත්ති ෂදියා රිෂාත් මහත්මිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන් ද,
54. අයිනුල් කරීමා හුසේන් මහත්මිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන් ද,
55. කරපුටුගල ගම් ආචාරිගේ නන්දාවතී මහත්මිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන් ද,
56. වික්‍රමනාරායන විජයරත්න මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
57. එස්. යෝගනාදන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
58. දිසානායක කෝරලගේ සංඝදාස දසනායක මහතා, මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
59. පුෂ්පකුමාර මහගම මුල්ලගේ මහතා, ගල්කිස්ස අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
60. ඒ. ඒ. ආරියපාල මහතා, ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
61. රොහාන් ඇන්තනී ඩෙනෂස් ප්‍රනාන්දු මහතා, කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
62. පී. එස්. ගෞතමදාස මහතා, අවිස්සාවේල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
63. තැඹිලියාගොඩ ගේ කරුණාරත්න මහතා, ගල්කිස්ස අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
64. එස්. මාටින් ඩයස් මහතා, මන්නාරම අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
65. ඩී. වී. එම්. රාජසිංහම් මහතා, යාපනය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
66. ජෝන් වික්ටර් නන්ද කොරායා මහතා, කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
67. එම්. එෆ්. එස්. මුහිඩ් මහතා, ගල්කිස්ස අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
68. රත්නාක මුදියන්සේලාගේ තිලක්කුමාර රත්නායක මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
69. තේමිය ලොකු බණ්ඩාර හුරුල්ලේ මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
70. සමරවික්‍රම ලියනගේ සෝමපාල සමරවික්‍රම මහතා, ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

පත් කරමි.

වි. ජ. මු. ලොකුබණ්ඩාර,
අධිකරණ, නීති ප්‍රතිසංස්කරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍ය.

2002 මාර්තු මස 22 වැනි දින,
කොළඹ 12,
අධිකරණ, නීති ප්‍රතිසංස්කරණ හා ජාතික
ඒකාබද්ධතා අමාත්‍යාංශයේ දී ය.

04-186

---

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය : 2/පිරි2/මාර/58.

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වන, 27 වන සහ 33 වන වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6)(අ), (ආ), (ඇ), (ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය, මාපලාන පිහිටි ශ්‍රී විමලජෝති පිරිවෙන 2001.01.01 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන්වහන්සේ වන පූජ්‍ය රොටුඹ – විමලජෝති ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6)(අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත්, මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

වී. කේ. නානායක්කාර,
ලේකම්,
මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු
ලේකම් සහ අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

2002 ජනවාරි මස 16 වැනි දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර, 'ඉසුරුපායේ',
මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ,
පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.

04–131

---

**1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත**

අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම්දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත, 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයන් ඉදිරියේ දක්වා ඇති ණයකරු, ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

02. මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයන් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත ආඥාපනතේ 25(1), 26(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එන්. ඩබ්ලිව්. ගුණදාස,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2002 මාර්තු මස 26 වැනි දින,
කොළඹ 10, පන්සල පාර,
අංක 47 දරන ස්ථානයේ පිහිටි,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| ඉල්ලුම් පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණය හිමිගේ නම සහ ලිපිනය |
|---|---|---|
| (1) 38776 | හෙට්ටිහන්දි කළුහේවා චන්ද්‍රලතා මෙන්ඩිස් මිය 'ශ්‍යාමලී', ගනේගොඩ, රත්ගම. | හෙට්ටිහන්දි කළුහේවා විමල් මෙන්ඩිස් මයා, ගනේගොඩ, රත්ගම |
| (2) 38815 | මනන්නලාගේ ප්‍රේමලාල් මහවලතැන්න මයා, 210/1, රංගල පාර, මකුල්දෙනිය. | මුණසිංහගේ ප්‍රේමදාස මුණසිංහ මයා, බොබැබිල, මකුල්දෙනිය. |
| (3) 38859 | හපුරුගල ගම්ලද්දලාගේ, ලීලාවතී මිය, ඉහළ පොහොරබාව, පරකඩුව. | අතුකෝරළගේ මල්ලිකා අතුකෝරළ මිය, උඩකඩ පාර, දෙල්ගමුව, කුරුවිට. |
| (4) 38870 | කුරුවිට ආරච්චිල්ලාගේ කුලරත්න මයා., ගල්ගොඩෙහේන, බෝපැත්ත පාර, ඉඹුලාන, රුවන්වැල්ල. | පුනහැලගේ හද්‍රා මංගලිකා කුමාරි මිය, කහටගස්තැන්න, රුවන්වැල්ල. |
| (5) 38874 | අතුරුලිය පල්ලියගුරුගේ මිහිරි අමරදේව, මයා., 33/27, ගලබැදිහේනවත්ත, වටරැක, මීගොඩ. | අකරවිටගේ හෙන්රි ප්‍රේමදාස මයා, 363, කටුවාන පාර, හෝමාගම. |
| (6) 38881 | ක්‍රිස්තේගුගේ මෙරිල්, ප්‍රනාන්දු මයා, අංක 564, චාල්ස් විලියම් මාවත, වෙන්නප්පුව. | වර්ණකුලසූරිය ජුඩ් ලලන්ත ප්‍රනාන්දු මයා., හලාවත, පාර, වෙන්නප්පුව. |
| (7) 38897 | පිලිප්පුවා හේවා විජිතා මිය., පිලිප්පුවා හේවා මාලනී මිය., වඩුමුල්ල, වතුගෙදර. | හොඳමුණි රොස්ලින්ද සොයිසා මිය. අංක 264 වඩුමුල්ල, වතුගෙදර. |
| (8) 38906 | දහනායක දොන් කුසුම්ලතා මිය, පන්සල පාර, කහවත්ත. | මුකලමයා මනන්නලාගේ ඇඩ්ලින් පද්මාවතී මිය., අංක 61, කෙළින් වීදිය, කහවත්ත. |
| (9) 38926 | තනිප්පුලි ආරච්චිගේ සරත්, 304/4, ගමගෙ වත්ත පාර, සාලමුල්ල, කොළොන්නාව. | දොන් කුලරත්න ජයසිංහ මයා, මැවැල්ල බෙහෙත් ශාලාව, ගොතටුව නව නගරය. |
| (10) 38932 | දසනායක රාල්ලාගේ සරත් දසනායක මයා, පිලවල, මහරන්ගල්ල, උඩුගොඩ. | 1. දහනායක විදානලාගේ ජයතිලක මයා., මහරන්ගල්ල, උඩුගොඩ.<br>2. ඇලබඩ කංකානමගේ රත්නපාල ප්‍රනාන්දු මයා., 6බී, දුම්රිය නිවාස, ඇස්. වීරරත්න මාවත, රත්මලාන. |
| (11) 38934 | දසනායක රාලලාගේ සරත් දසනායක මයා, පිලවල, මහරන්ගල්ල, උඩුගොඩ. | ඊරියමුල්ල රාළලාගේ පොඩිමැණිකේ මිය., තිබ්බුටුමුණුව, හෙට්ටිමුල්ල. |
| (12) 38944 | පුනැහැල විදානෙලාගේ සෝමතිලක මයා., අම්පාන විදානෙලාගේ කුසුමාවතී මිය., අක්කර 09, ලැවන්ට් පාර, යටියන්තොට. | කිතුල්ගොඩ ගමරාලලාගේ රංජිත් රෝහණ කිතුල්ගොඩ මයා., අංක 103, ගරාගොඩ, යටියන්තොට. |
| (13) 38952 | මුතුගල් පේඩිගේ සහිඳු මයා., 413, කොත්හේන, බඩල්ගම. | අතුකෝරල විදානලාගේ චන්ද්‍රසිරි මයා., 79/බී, කොළඹ පාර, ගම්පහ. |
| (14) 38959 | උළුගේ තැන්නේ රියන්ස් චන්ද්‍ර කුමාර දිසානායක මයා., 173, නුවර පාර, කඩුගන්නාව. | සේනාරත්න මාරසිංහ මයා., කඳන්ගම, කඩුගන්නාව. |
| (15) 38961 | උපාසක ගෙදර කාරියවංශ ලීලාරත්න මයා., වෙලේගෙදර සීලවතී මිය., උපාසක ගෙදර තිලකසිරි වනිගරත්න මයා., උපාසක ගෙදර මහෙන්ද්‍ර ජයලත් මයා., අංක 80, දීවිල්ල, යටවත්ත, මාතලේ. | බෝදාදුර ගෙදර රංජිත් වීරසේන යෙලක්කරය, දීවිල්ල, යටවත්ත. |
| (16) 38979 | රණසිංහ ආරච්චිගේ ගාමිණී රණසිංහ මයා., අංක 417බී පරණ පාර, කොට්ටාව, පන්නිපිටිය. | පට්ටියගේ ජයරාජ් පීරිස් මයා., 123, පංසල පාර, මහරගම. |
| (17) 38992 | හෙට්ටියාදුර රෙක්ස් වෝල්ටර් ප්‍රනාන්දු මයා., ඇතිගේ අසුන්තා කොන්ස්ටන් රොයෙලා සිල්වා තිලකරත්න මයා., 38, පොලිසිය මාවත, තේවත්ත පාර, රාගම. | ඇතිගේ නෙවිල් ප්‍රැන්ක්ලින් සිල්වා මයා., 457, පොඩිකුඹුර, රාගම. |
| (18) 38827 | සිවරත්න බණ්ඩාරනායක යාපා, මුදියන්සේලාගේ පුංචි බණ්ඩා මයා., කුරුදුල්ල, නිකදලුපොත | ලිඳමුල ආරච්චිගේ මාග්‍රට් නෝනා මිය., අඹකොළ වැව, ගනේවත්ත, නිකදලුපොත. |

04 – 148

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මහජන බැංකුව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2001.07.25 දින පැවති ඔවුන්ගේ රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමට මඩකලපුවේ ප්‍රසිද්ධ නොතාරිස් එම්. අයි. එම්. නූර්ධීන් මහතා විසින් සහතික කරන ලද අංක 9224 දරන හා 1999.06.23 වැනි දිනැති උකස් බැඳුම්කරය මත මහජන බැංකුවට අයවිය යුතු ගෙවීම් කිරීම ආදම්බාබා මොහොමඩ් විබ්ලර් මහතා විසින් පැහැර හැර ඇති හෙයින් දැනට එකී අංක 9224 දරන උකස් බැඳුම්කරය මත මහජන බැංකුවට රුපියල් තුන්ලක්ෂ හයදහස් දෙසීයක (රු. 3,06,200) මුදලක් අයවිය යුතුය. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම රුපියල් තුන්ලක්ෂ හයදහස් දෙසියක (රු. 3,06,200) මුදල 2000.09.16 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් එම රුපියල් තුන්ලක්ෂ හයදහස් දෙසීයක (3,06,200) මුදලට වර්ෂයකට සියයට විසිහතර (24%)ක බැගින් තවදුරටත් පොළියද, එදිනතෙක් කරනු ලැබ ඇති ගෙවීම ද, විකිණීමේ ගාස්තු ද (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් අයකර ගැනීම සඳහා එම අංක 9224 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය (කිසිවක් වේ නම්) මඩකලපුව, ජයන්තිපුරම්, පාසල් වීදියේ පදිංචි බලයලත් වෙන්දේසිකරු කනගනායගම් රෙට්නරාජා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### දේපළ පිළිබඳ විස්තරය

නැගෙනහිර පලාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනයි පත්තුවේ, කාත්තාන්කුඩි ප්‍රාදේශීය සභා සීමාව තුළ වාට්ටුව 3, කාත්තාන්කුඩි කොට්ඨාශ 2, පිහිටි වරිපනම් අංක 134/4 දරන බලයලත් මිනින්දෝරු ඒ. සිංගරාජා මහතා විසින් සාදන ලද අංක ඒ. එස්/ 93/85 හා 1993.04.17 වැනි දින දරන සැලැස්මේ ලකුණුකර වෙන්කළ ඉඩමේ උතුරට : පටුමග ද, නැගෙනහිරට : මොහිදීන් මෙත්තපල්ලි පරිශ්‍රය ද, දකුණට: නගර සභා පරිශ්‍රය ද, බස්නාහිරට: ආදදිබාබා සිත්ති රෂිනාගේ ඉඩම ද ඇති පර්චස් දහතුනයි දශම හතක (අ. 0, රූ. 0, පර්. 13.77) විශාලවූ මඩකලපුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පො. පිටු. ඒ 545/72 හි ලියාපදිංචිකර ඇති ඉඩම සහ එහි පිහිටි සියලුදේත්ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ප්‍රාදේශීය කළමනාකරු (මඩ).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
මඩකලපුව.

04 -167

## මහජන බැංකුව- වෙන්නප්පුව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වන යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2001.11.29 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දංකොටුව ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. එෆ්. රන්දෙනිය විසින් සහතික කරන ලද 1999.03.17 දිනැති අංක 7437 දරන උකස්කරය ද, 1996.11.29 දිනැති අංක 4768 දිනැති උකස්කරය හා 1997.06.30 දිනැති අංක 5458 දිනැති උකස්කරය ද යන උකස්කරයන් ප්‍රකාර ගෙවීම් සනීද චන්ද්‍රා වෙක්කසිංහ සහ ගැමුණු චන්ද්‍රා වෙක්කසිංහ යන අයවලුන් විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරයන් යටතේ රුපියල් පහළොස් ලක්ෂ අසූහය දහසක (15,86,000) මුදලක් රුපියල් නව ලක්ෂ හැටපන් දහස් නවසිය හැටතුනයි ශත විසිනවයක (රු. 9,65,963.29) මුදලක් හා රුපියල් හැත්තෑ ලක්ෂ දෙදහස් එකසිය විසිහයක (රු. 70,02,126) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින්ද, රුපියල් පහළොස් ලක්ෂ අසූහය දහසක (රු. 15,86,000) මුදල සඳහා 2002.02.28 දින සිට වර්ෂයකට සියයට විසි දෙකයි දශම පහ (22.5%) බැගින් ද, රුපියල් නව ලක්ෂ හැටපන් දහස් නවසිය හැටතුනයි ශත විසිනවය (රු. 9,65,963.29) ක මුදල සඳහා 2001.06.11 දින සිට වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් ද, රුපියල් ලක්ෂ හැත්තෑවක (රු. 70,00,000) මුදල සඳහා 1999.10.09 දින සිට වර්ෂයකට සියයට විසිපහ (25%) බැගින්ද වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය, පිරිවැටුම් බදු, ආරක්ෂක බදු හා වෙන්දේසි ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් පහළොස් ලක්ෂ අසූහය දහසක (15,86,000) මුදල රුපියල් නවලක්ෂ හැටපන් දහස් නවසිය හැටතුනයි ශත විසිනවයක (රු. 9,65,963.29) මුදල හා රුපියල් හැත්තෑ ලක්ෂ දෙදහස් එකසියක විසිහයක (රු. 70,02,126) මුදල අයකර ගැනීම සඳහා මීගමුව බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා මහතා විසින් එකී අංක 7437, 4768 සහ 5458 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ පැවරිය ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාශයට අයත් දකුණු පිටිගල් කෝරළේ, කම්මල්පත්තුවේ, වෙන්නප්පුව ග්‍රාමයේ පිහිටි මකුල්ලගහවත්ත, කෝන්ගහවත්ත, දන්පතහෙකෝන්ගහ ගොඩබිම සහ මාදන්ගහහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. එච්. ඊ. මෙන්ඩිස් මහතා විසින් මැන සාදන ලද 1987.07.05 දිනැති අංක 4585 දරන පිඹුර ප්‍රකාර බෙදී වෙන්වුන ලොට් අංක 01, 02, 03, 04 සහ 05 දරන ඒකාබද්ධ ඉඩමට මායිම්, උතුරට : රජයේ ඉඩම සහ මරිනෝ (වඩාත් නිවැරදි ලෙස මරියානු) පින්තු සතු ඉඩම ද, නැගෙනහිරට : මරිනෝ පින්තු (වඩාත් නිවැරදි ලෙස මරියානු පින්තු) සතු ඉඩම ද, දකුණට : වෙන්නප්පුව සිට ලුනුවිලට යන මහා මාර්ගය සහ සාදිරිස්හාමි සහ තවත් අය සතු ඉඩම ද, බස්නාහිරට : ජේ. ජේ. පින්තු මාවත ද යන මායිම් තුළ පිහිටි අක්කර දෙකයි රූඩ් දෙකයි පර්චස් දාහතයි දශම හයක (අක්. 02, රූඩ් 02, පර්. 17.6) විශාල ඉඩම හා එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේත්ද වේ.

මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 60/105 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ප්‍රාදේශීය කළමනාකරු-හලාවත.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79, මාරවිල පාර,
නාත්තන්ඩිය.

04 -164

## මහජන බැංකුව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ වන යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1999.08.13 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල පදිංචි ප්‍රසිද්ධ නොතාරිස් කේ. පී. ලයනල් මහතා විසින් සහතික කරන ලද 1995.12.20 දින අංක 2823 දරන උකස්කරයන් ප්‍රකාර ගෙවීම් සුසිලා කාමනී විදානගමගේ සහ ජයකොඩි ආරච්චිලාගේ දොන් විජිත ජයකොඩි යන අයවලුන් විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් තුන්ලක්ෂයක (රු. 3,00,000) මුදලක් දැනට මහජන බැංකුවට ගෙවීමට ඇති බැවින්ද, 1997.03.31 දින සිට 29% බැගින් රුපියල් තුන්ලක්ෂයක් (රු. 3,00,000) සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ වෙන්දේසි ගාස්තුද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් තුන්ලක්ෂයක (රු. 3,00,000) මුදල අයකර ගැනීම සඳහා කුරුණෑගල බලයලත් වෙන්දේසිකාර ඩබ්. එම්. අයි. ගල්ලැල්ල මහතා විසින් එකී අංක 2823 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තර

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඩවිල්ලි හත්පත්තුවේ, ගන්දහය කෝරළේ මාවතගම ගමේ පිහිටි වලව්වේවත්ත නමැති ඉඩමට බලයලත් මානක කේ. කණගසිංහම් මහතා විසින් මැන සාදන ලද අංක 205 සහ 1985.05.02 දිනැති පිඹුරේ සඳහන් කැබලි අංක 4 දරන පර්චස් පහයි දශම එකයි පහක් (අ. 0, රූ. 0, පර්. 5.15) විශාල ඉඩමට එකී පිඹුරේ ප්‍රකාර මායිම්, උතුරු-නැගෙනහිරට : යෝජිත පාර දැනට අඩි 20 ක් පළල පාර ද, දකුණු-නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 5 ද, දකුණු-බස්නාහිරට :එකී පිඹුරේ කැබලි අංක 4 ඒ ද, උතුරු-බස්නාහිරට : එකී පිඹුරේ කැබලි අංක 3 ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩම සහ ඊට අයිති ගෙවල් ගොඩනැගිලි ගහකොළ පළතුරු ගොඩනැගිලි ආදී සියළු දේත් ද වේ. එකී පිඹුරේ නිරූපිත පාර පොදුවේ ප්‍රයෝජනයට ගැනීමේ සහ නඩත්තු කිරීමේ අයිතිවාසිකම් ද සමග වේ.

මෙම ඉඩම කුරුණෑගල ඉඩම් කාර්යාලයේ ඒ. 1201/45 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ප්‍රාදේශීය කළමනාකරු.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 03, වත්හිමි පාර,
කුරුණෑගල.

04 -163

## මහජන බැංකුව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2001.08.29 වන දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් සෙනෙවිරත්න මුදියන්සේලාගේ දීපදු කුමාරි මහත්මිය විසින් සහතික කරන ලද 1999.10.21 දිනැති අංක 238 දරන උකස්කරය ප්‍රකාර රණතුංග ජයසේකර කෝරාලලාගේ උදයසිරි රණතුංග සහ වැත්තැවේ කංකානම්ගේ චාර්ලිස් සිංඤෝ යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් පන්ලක්ෂ දහදාහක් (රු. 5,10,000) මුදලක් දැනට මහජන බැංකුවට ගෙවීමට ඇති බැවින් ද, 2000.04.26 දින සිට වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් රුපියල් පන්ලක්ෂ දහදාහක් (රු. 5,10,000) සඳහා වෙන්දේසි දින දක්වා තවදුරටත් පොළිය සහ වෙන්දේසි ගාස්තු ඇතුළුව වෙනත් ගාස්තු ඇත්නම් ඒවාද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් පන්ලක්ෂ දහදාහක (රු. 5,10,000) මුදල අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින් එකී අංක 238 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත වර්ෂ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තරය

උතුරු මධ්‍යම දිසාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, දකුණු කලාගම් කෝරලේ අංක 627 මරදන්කඩවල පාර, ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ඔළුකරද නමැති ගමේ පිහිටි සර්වේ ජනරාල් භාරයේ ඇති අංක 864 දරන ප්ලෑනේ සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : ඩබ්.

කේ. දාවිත් සිංඤෝගේ ඉඩම ද ; නැගෙනහිරට : ඩබ්ලිව්. කේ චාර්ලිස් සිංඤෝගේ ඉඩම ද ; දකුණට : ඩබ්. කේ. ආතර්ගේ ඉඩම ද ; බස්නාහිරට : එස්.ඒ.ආරියවතීගේ ඉඩම ද යන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකක් (අක්. 01) විශාල ඉඩම සහ ඊට අයිති සියලු දේත් වේ. ඉහත කී ඉඩම ඩබ්ලිව්. ඩී. දසනායක මිනින්දෝරු තැන විසින් 1998.03.17 දින මැන සාදන ලද අංක 3281 දරන ප්ලෑනේ ලොට් අංක 01ජී. පෙන්වන කොටසට එකී ප්ලෑන ප්‍රකාර, උතුරු මාධ්‍යම දිසාවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කලාගම් පළාතේ කලාගම් කෝරලේ වැව් තුලානේ, මලව ගමේ පිහිටි එස්. වී. පී. 864 ලොට් අංක 307 සඳහන් ගොඩ ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර හා රක්ෂිතය ද; නැගෙනහිරට : පාර ද ; දකුණට : ඩබ්ලිව්. කේ. චාර්ලිස් සිංඤෝගේ ඉඩමේ ඉතිරිය ද ; බස්නාහිරට : එස්. ආර්. ගාල්ලගේ ඉඩම ද යන මායිම් වූ අක්කර එකක් (අක්. 01) හෙවත් හෙක්ටයාර් දශම හතරයි බිංදුවයි හතරයි බිංදුවක් (හෙ. 0. 4040) විශාල ඉඩම හා එහි තුල පිහිටි ගොඩනැගිලි ගහකොළ, පළතුරු ආදී සැම සියලු දේත් වේ.

මෙම දේපළ අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත. ජ/ගු 80/115 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ප්‍රාදේශීය කළමනාකාර,
අනුරාධපුර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අනුරාධපුරය.

04-165

---

## මහජන බැංකුව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ වන යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2001.05.24 පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් වසන්තා අමරසේකර මහත්මිය විසින් සහතික කරන ලද 1999.09.20 දින අංක 6746 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, නිමල් රත්නසිරි ආධිහෙට්ටි සහ සරත් ගාමිණී කුරුප්පුආරච්චි, ශිරෝමි ස්වර්ණදිමුතු ආදිහෙට්ටි යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරයන් යටතේ රුපියල් හාරලක්ෂ දහසය දහස් හැට හතක් (රු. 4,16,067) දැනට මහජන බැංකුවට ගෙවීමට ඇති බැවින් ද, 2000.10.31 දින සිට 24% බැගින් රුපියල් හාරලක්ෂ දහසය දහස් හැට හතක් (රු. 4,16,067) සඳහා වෙන්දේසි දිනය තවදුරටත් පොලිය සහ වෙන්දේසි ගාස්තු ද, සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ඇත්නම්, ඒවා අඩුකර එකී රුපියල් හාරලක්ෂ දහසය දහස් හැට හතක (රු. 4,16,067) මුදල අයකර ගැනීම සඳහා කුරුණෑගල බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. එම්. අයි. ගල්ලැල්ල මහතා විසින් එකී අංක 6746 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, උඩුගහපත්තුවේ සල්පිටි කෝරලේ, මත්තේගොඩ තිබෙන මත්තේගොඩවත්ත යන ඉඩමට බලයලත් මිනින්දෝරු, ජේ. ජී. එන්. ජයසුන්දර මහතා විසින් මැන සාදන ලද අංක 787 සහ 1997.07.10 දිනැති පිඹුරේ දැක්වෙන ලොට් අංක 50 දරන ඉඩමට මායිම්, උතුරට : කැබලි අංක 31 ද ; නැගෙනහිරට : කැබලි අංක 92 ද ; දකුණට : කැබලි අංක 78 ද ; බටහිරට : කැබලි අංක 51 ද, යන මෙකී මායිම් තුළ වූ පර්චස් තිස් හතරයි දශම අටක් (අක්කර 00, රූඩ් 00, පර්. 34.8) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගසකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සැම සියළු දේද සමඟ වේ. (එන්. 268/178-කොළඹ)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ප්‍රාදේශීය කළමනාකරු.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 03, වත්හිමි පාර,
කුරුණෑගල.

04-166

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය ) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2001 නොවැම්බර් මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. කොළඹ මහජන නොතාරිස් සරෝජා ජසන්තුලියන මිය විසින් සහතික කරන ලද 1989.01.18 දිනැති අංක 1286 කොළඹ මහජන නොතාරිස් රාධා කන්දසාමි මිය විසින් සහතික කරන ලද 1993.07.29 දිනැති අංක 868 මහජන නොතාරිස් එම්. ඩී. පී. එස්. කරුණානායක මිය විසින් සහතික කරන ලද 1995.10.02 දිනැති අංක 73 මහජන නොතාරිස් කාරියවසම් කනත්තගේ පද්මිණී රේණුකා ද සිල්වා මිය විසින් සහතික කරන ලද 1998.12.16 දිනැති අංක 284 දරන බැඳුම්කර මත මුල් මුදල හා 2001.09.30 දින තෙක් පොලිය වශයෙන් රුපියල් නව කෝටි අනූහය ලක්ෂ තිස්අටදහස් පන්සිය දාහතරක (රු. 9,96,38,514) මුදලක් සමඟ රුපියල් හයකෝටි හතලිස් පන්ලක්ෂ අනූනවදහස් නවසිය හැටනවයක (රු. 6,45,99,969) මුදලක් මත වසරකට සියයට විසිදෙකයි දශම පහ (22.5%) බැගින් පොලියක්, 2001.10.01 වෙනි දින සිට ගෙවීම් නිම කරන දිනය තෙක් කොළඹ 11, බංගසාල වීදිය, අංක 54හි පිහිටි සීමාසහිත ඊස්ට් වෙස්ට් (ක්ලියරිං ඇන්ඩ් පෝවර්ඩිං) ආයතනයෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 1286,868,73 සහ 284 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් නවකෝටි අනූහයලක්ෂ තිස්අට දහස් පන්සිය දාහතරක (රු. 9,96,38,514) මුදල සමඟ 2001.10.01 වෙනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද, අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට, කොළඹ 03, ධර්මපාල මාවත, 55ඒ හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ ද, එකී ලංකා බැංකු ආඥාපනතේ 21 වෙනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ අයකර ගැනීමේ ඒකකයේ සම්බන්ධතා කළමනාකරුට මෙයින් අවසරදී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහ නගර සභා සීමාවේ කොටුව කොට්ඨාශයේ පිහිටි බංගසාල වීදියේ දැන් වරිපනම් අංක 54, 54 (1/1, 2/1, 3/1 සහ 3/2) දරන ඉඩම් කැබැල්ල උතුරට : බංගසාල වීදිය ද ; නැගෙනහිරට: බංගසාල වීදියේ වරිපනම් අංක 70 දරන පරිශ්‍ර සහ පළමුවන හරස් වීදියේ අංක 41 ද ; දකුණට : කෙළින් වීදිය වරිපනම් අංක 103, 107, 109 සහ 111 දරන පරිශ්‍රය ද ; බස්නාහිරට : බංගසාල වීදියේ වරිපනම් අංක 52 දරන පරිශ්‍රය ද මායිම්ව එකී අංක 1057 දරන පිඹුර අනුව පර්චස් විසිදෙකයි දශම අටක (අ. 0, රූ. 0, පර්. 22.8) ප්‍රමාණයෙන් යුක්තවේ.

එස්. තිලකරත්න,
සම්බන්ධතා කළමනාකරු.
(අයකර ගැනීම්)

ලංකා බැංකුව,
අයකර ගැනීමේ ඒකකය,
3 වෙනි මහල,
ප්‍රධාන කාර්යාලය,
අංක 4, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

04-160

---

## මහජන බැංකුව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2001.07.25 වන දින පැවැති ඔවුන්ගේ රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ :-

මහජන බැංකුවේ නමට මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් එම්. අයි. එම්. නූර්ඩීන් මහතා විසින් සහතික කරන ලද අංක 9243 දරන හා 1999.07.05 වැනි දිනැති උකස් බැඳුම්කරය මත මහජන බැංකුවට අයවිය යුතු ගෙවීම් කිරීම්, උතුමාන්පිල්ලේ මොහමඩ් හස්බුල්ලා සහ බිරිඳ අහමඩ්ලෙබ්බෙ ලතීෆාබීවී විසින් පැහැර ඇති හෙයින් ද, දැනට එකී අංක 9243 දරන උකස් බැඳුම්කරය මත මහජන බැංකුවට රුපියල් අටලක්ෂ පහලොස්දහස් හත්සිය පනහක (රු. 8,15,750) මුදල අයවිය යුතුය. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකුව පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, එම රුපියල් අටලක්ෂ පහලොස් දහස් හත්සිය පනහ (රු. 8,15,750) මුදල , 2000.06.28 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් එම රුපියල් අටලක්ෂ පහලොස්දහස් හත්සිය පනහ (රු. 8,15,750) මුදලට වර්ෂයකට සියයට විසි හතර (24%) බැගින් තවදුරටත් වූ පොලිය ද, එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම ද විකිණීමේ ගාස්තු ද, (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් අයකර ගැනීම සඳහා එම අංක 9243 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය (කිසිවක්වේ නම්,) මඩකලපුව, ජයන්ති පුරම්, පාසල වීදියේ, පදිංචි, බලයලත් වෙන්දේසිකාර කනගනායගම් රෙටිනරාජා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### දේපළ පිළිබඳ විස්තරය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනයි උපදිසාපති කොට්ඨාශයේ කාත්තාන්කුඩි ගමේ 6 වැනි කොට්ඨාශයේ, පිහිටි කාත්තාන්කුඩි නගර සභා සීමාව තුළ 6 වැනි වාට්ටුවේ බලයලත් මිනින්දෝරු සී. පත්මනාදන් මහතා විසින් සාදන ලද අංක ඒ. එස්./467/89 හා 1989.10.18 වැනි දින දරන සැලැස්මේ ලකුණු කර "මේවීටුපුමී වලවු" යැයි හඳුන්වන බෙදා වෙන්කළ ඉඩමේ උතුරට : සිත්ති මර්ලියාගේ ඉඩමද ; නැගෙනහිර දකුණ හා බස්නාහිරට: පටුමග ද ඇති පර්චස් පහයි දශම හතයි පහ (අ. 0, රූ. 0, ප. 5.75) විශාල වූ මඩකලපුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පො. පිටු ඒ 416/202 හි ලියාපදිංචිකර ඇති ඉඩම සහ එහි පිහිටි සියලුදේත්.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ප්‍රාදේශීය කළමනාකරු, (මඩ).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
මඩකලපුව.

02-168

---

## මහජන බැංකුව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1998 අප්‍රේල් 02 වන දින පැවැත් වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ :-

මහජන බැංකුවේ නමට කොළඹ නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. එස්. ඩබ්ලිව්. අමරසිංහ මහත්මිය විසින් සහතික කරන ලද අංක 3049 සහ 1994 නොවැම්බර් මස 24 වන දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම, විතානගේ දොන් ප්‍රේමතුංග සහ ( උකස්කරු වශයෙන් ) ශ්‍රීමා ශාන්ති ලේඛා ප්‍රේමතුංග යන අය විසින් පැහැර ඇති හෙයින් ද, දැන් එකී බැඳුම්කරය මත රුපියල් නවලක්ෂ අනූතුන්දාහක (රු. 9,93,000) මුදලක් සහ රුපියල් හයලක්ෂ අසූදාහක් (රු. 6,80,000) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රුපියල් නවලක්ෂ අනූතුන්දාහක් (රු. 9,93,000) එකී මුදල ද, රුපියල් හයලක්ෂ අසූදාහක (රු. 6,.80,000) එකී මුදල ද, 1995 අප්‍රේල් 22 දිනසිට විකිණීමේ දිනය තෙක් රුපියල් නවලක්ෂ අනූතුන්දහක් (රු. 9,93,000) මුදල මත වර්ෂයකට සියයට විසිපහ (25%) බැගින් තවදුරටත් වූ පොලිය ද, 1997 ජනවාරි මස 5 දිනසිට විකිණීමේ දිනය තෙක්, රුපියල් හයලක්ෂ අසූදාහක (රු. 6,80,000) මුදලක් මත වර්ෂයට සියයට විසිහය (26%) බැගින් තවදුරටත් වූ පොලිය ද, විකිණීමේ ගාස්තු ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම ද විකිණීමේ ගාස්තු ද (කිසිවක් මේ නම්) අඩු කිරීමෙන් පසුඅයකර ගැනීම සඳහා අංක 3049 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ වි කිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ කෝට්ටේ නගරසභා සීමාව තුළ පිහිටියා වූ ද ගංගොඩවිල කනත්ත පාරේ, වරිපනම් අංක 19 දරන දවටගහලන්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු සී .ආර්. හාර්ඩින් විසින් සාදන ලද අංක 405 සහ 1945 ඔක්තෝබර් මස 30 වන දින දරන සැලැස්මේ ලොට් අංක 'බී1' වශයෙන් ලකුණු කොට නිරූපණය කර ඇත්තාවූ ද, උතුරට : එම ඉඩමේ ලොට් අංක 'බී' වශයෙන් ලකුණු කළ ඉඩම ද ; නැගෙනහිරට : කනත්තපාර ද; දකුණට : එම ඉඩමේ ලොට් අංක 'සී' දරන කොටස ද ; බස්නාහිරට : එච්. ඩී. කන්කානි අප්පුගේ සහ එච්. සින්ඤෝ අප්පුගේ අඹගහවත්ත ද, පර්චස් විස්සක් (අ. 0, රූ. 0, ප. 20) විශාල වූ ද බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි ගහකොළ, වැව්ලි සහ වෙනත් සියලු දේත්ය.

කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 895 /188 හි ලියාපදිංචි කරන ලදී.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ප්‍රාදේශීය කළමනාකරු,
කොළඹ (පිටත).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ (පිටත),
අංක 177, හයිලෙවල් පාර,
නුගේගොඩ.

04-169

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1130815701.

ණය ගිණුම් අංකය : 39103.

2000.04.28 වන දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී. :-

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඩී. එම්. ඉසෙඩ් ෆැර්නැන්ඩු මහතා විසින් සහතික කරන ලද්දා වූද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූද, 1996 පෙබරවාරි මස 14 වන දින හා අංක 6340 ද, 1996 අගෝස්තු මස 23 වන දින හා අංක 6511 ද, 1996 දෙසැම්බර් මස 23 වන දින හා අංක 6600 ද සහ 1997 අගෝස්තු මස 15 වන දින හා අංක 6796 ද, දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මීගමුව, පෙරියමුල්ලේ, මුස්ලිම් පල්ලිය පාරේ, අංක 84/2 ඒ දරන ස්ථානයේ පිහිටි "නිගම්බු කුෂන්ස්" හි අයිතිකරු වන සෙල්ලදුරෙයි රාජකුමාර් විසින් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුමකර යටතේ රුපියල් අටලක්ෂ විසිඅට දහස් නවසිය අනූ හතරයි ශත හැත්තෑ අටක (රු. 8,28,994.78) මුදලක් 2000 ජනවාරි මස 25 වන දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් ට අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් අටලක්ෂ විසිඅට දහස් නවසිය අනූ හතරයි ශත හැත්තෑ අටක (රු. 8,28,994.78) මුදලට 2000 ජනවාරි මස 26 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 1,88,880.06 ක මුදල සඳහා 28% ක සහ රු. 4,85,378.39 ක මුදල සඳහා 28% ක වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදලත් අඩුකොට එකී අංක 6340, 6511, 6600 සහ 6796 දරන උකස් බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස්කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බලයලත් මානක ආර්. අයි. ෆැර්නැන්ඩු මහතා විසින් 1992 නොවැම්බර් මස 13 වන දින සාදන ලද අංක 4055 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ මීගමුව ලියාපදිංචි කොට්ඨාශය තුළ ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහනගර සභා සීමාව තුළ හුණුපිටිය හතරවන කොට්ඨාශයේ පිහිටි දවටගහවත්ත, පරාබොඩ කොස්ගහවත්ත, රුක්අත්තනගහවත්ත සහ දවටගහවත්ත නමැති ඉඩමේ බෙදා වෙන්කරන ලද ලොට් 2 දරන ඉඩමට මායිම්, උතුරට : අල්හාජ් සහීඩ් මරික්කාර් මාවත සහ එල්. මරුසුන්ට අයිති දේපළ ද, නැගෙනහිරට : එම්. මරුක්සූර්ට අයිති දේපළ සහ ආර්. නවසිවායම්ට අයිති දේපළ ද, දකුණට : එල්. ජේ. ටී. ගුණවර්ධනට හිමි දේපළ ද සහ බස්නාහිරට : ලොට් 1 ද, යන මායිම් තුළ පර්චස් නවයයි දශම හතක් (අ. 0, රූ. 0, පර්. 9.7) විශාලත්වයෙන් යුත් ඉඩම සහ එහි තුළ පිහිටි වගාවන් සහ සියළු දේත් සමග වේ.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

04-180

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2002 අප්‍රේල් මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2002 අප්‍රේල් මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

නෙවිල් නානායක්කාර,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2002 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

රජයේ මුද්‍රණාලයාධිපති විසින් ප්‍රකාශ කරන ලදි.
මුද්‍රණය හා බෙදාහැරීම සීමා සහිත ශ්‍රී ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම මගිනි.